




# මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

## වාර්ෂික වාර්තාව

## 2021

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා
අභ්‍යාස ආයතනය
“රුවන් සෙවන”
නො:73/5/A,
වැලිවිට
2022.02.28

ගරු අමාත්‍යතුමා
කර්මාන්ත අමාත්‍යාංශය
තැ.පෙ 570,
73/1
ගාලු පාර,
කොළඹ-03

ගරු අමාත්‍යතුමනි,

**වාර්ෂික වාර්තාව 2021**

1971 අංක (2) 14 38 උප වගන්තිය ප්‍රකාරව පහත සඳහන් ලේඛන ඔබ වෙත ඉදිරිපත් කරමි.

1. 2021 වර්ෂය සඳහා වූ මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ පාලන වාර්තා
2. 2021 දෙසැම්බර් 31 දිනට කාර්ය සාධන වාර්තාව.

මෙයට විශ්වාසි

මහාචාර්ය පී.ජී.ආර්. ධර්මරත්න
සභාපති
මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

# දැක්ම මෙහෙවර හා අභිමතාර්ථ

## දැක්ම

" මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධිය හා සංවර්ධනය සඳහා අදාල පර්යේෂණ හා පුහුණු කටයුතු කරමින් කලාපයේ විශිෂ්ඨතම පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය වීම"

## මෙහෙවර

" මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ඉතා තරඟකාරී මට්ටමේ කුසලතාවයන් වැඩි දියුණු කිරීම තුලින් අප සේවා දායකයන්ට උපරිම අන්දමේ සේවාවක් ලබා දීමට අදාල නව මැණික් නැන්පතු හඳුනා ගැනීම සඳහා ගවේෂණ කටයුතු මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධියට අදාල නව නිපැයුම් බිහි කිරීම හා ඒවායේ අගය වැඩි කිරීමට අදාල ශිල්පීය හා තාක්ෂණික දැනුම හා කුසලතා වලින් පිරිපුන් ශ්‍රමිකයන් බිහි කිරීම මෙන්ම කර්මාන්තයට අදාල වැඩමුළු සඟරා පොත්පත් හා පර්යේෂණ ග්‍රන්ථ පල කිරීම අපගේ මෙහෙවරයි "

## අභිමතාර්ථ

" ශ්‍රී ලංකාවේ මැණික් බනිජ සම්පත් විභව ප්‍රදේශ ගවේෂණය කර තිරසාර ලෙස නෙලා ගැනීම සහ නව තාක්ෂණික ක්‍රම පිළිබඳ පුහුණුවක් සහිත ශ්‍රමිකයන් තුලින් ජාතික ආර්ථිකයට දායක වීම"

## 2.1. අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

2021 වර්ෂය තුල ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංයුතිය පහත සඳහන් පරිදි විය.

| | | |
|---|---|---|
| 01 | මහාචාර්ය පී.ජී.ආර්.ධර්මරත්න මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සභාපති<br>2021.12.27 සිට මේ දක්වා |
| 02 | වයි.කේ.ටී.පී. වීරසිංහ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සභාපති<br>2020.01.03 සිට 2021.12.26 දින දක්වා |
| 03 | අයි.එස්.එච්.ජේ. ඉලුක්පිටිය මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>2020.08.28 සිට 2021.06.30 දින දක්වා |
| 04 | අමිල ඉන්දික මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>2020.01.21 සිට 2021.10.13 දින දක්වා |
| 05 | ප්‍රභා මලලසේකර මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>2020.01.22 සිට මේ දක්වා |
| 06 | ආර්.එම්.ඩී.කේ.ජී.එන්.බී.රණතුංග මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>2021.10.14 සිට මේ දක්වා |
| 07 | අනුර වල්පොල මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>2020.02.26 සිට 2021.12.31 දක්වා |

# ඉහළ කළමණාකාරීත්වය



**මහාචාර්ය පී.ජී.ආර්.ධර්මරත්න**

**සභාපති**

(From 27.12.2021 to date)
BASc (SL),MSc (Newcastle),
Ph.D(Leeds),FIE,FGG,FGA,C.Eng



**ඩබ්.කේ.ටී.පී .වීරසිංහ මහතා**

**සභාපති**

(Until 2021.12.26)



**බී.ජී.ආර්.ඩබ්. ගම්ලත් මහතා**

**අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)**

(From 23.11.2021 to date)
MSC (Gem),B.Sc (SP) (Physics) FGA,
MGA (SL),MBA(Reading)



**තිලක් ධර්මරත්න මහතා**

**අධ්‍යක්ෂ ජනරාල්**

(until 07.11.2021)
B.Sc.,M.Sc.(Oceanography,UK),M.Sc.
(Gem.SL),M.PM (Project Mgt.SLIDA), Dip in
Mgt.(NIBM),MGA(SL),MGSSL(SL) M (IGSL)



**බී.ජී.ආර්.ඩබ්. ගම්ලත් මහතා**

**අධ්‍යක්ෂ (පුනුණු හා සංවර්ධන)**

MSC (Gem),B.Sc (SP) (Physics) FGA,
MGA (SL),MBA(Reading)



**ආර්.එම්.එන්.පී.කේ ජයසිංහ**

**අධ්‍යක්ෂ(පර්යේෂණ) වැ.බ**

M.Phil(Gem.),M.Sc(GIS & RS),B.Sc.
(Geology),MIGSL,MGSSL,MGASL



**එස්.එල්.පේ. මුහන්දිරම් මහතා**

**සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)**

MPAcc(USJP),B.com (SP)Accountancy 2nd
lower Hons (USJP),CBA(ICASL),ADV.Cer
(Procurment)(ICTAD



**ජේ.ඒච්.අයි.එස්.ජයමහා**

**සහකාර අධ්‍යක්ෂ**
**(පරිපාලන හා මානව සම්පත්)**

Mrs. J.H.I.S3 Jayamaha
B.Sc. Chemistry (Special)(USJP)

## 3. සමාලෝචිත වර්ෂයේ අවස්ථා සහ අභියෝග පිළිබඳ සභාපතිතුමාගේ සමාලෝචනය

### 1.3 අවස්ථා

- **පර්යේෂණ සහ පුහුණු සඳහා ඉල්ලුම වැඩි කිරීම.**

  ආයතනයේ සේවාවන් සඳහා දේශීය හා විදේශීය ඉල්ලුම් වර්ධනය වෙමින් තිබේ .මෙම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින් සඳහා හොඳ ඉල්ලුමක් පැවතීම මෙම ඉල්ලුම වර්ධනය කිරීමට හේතු වී ඇත .මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ සේවාවන් වල ගුණාත්මක තත්වය ඉහල නැංවීමට ගත් ක්‍රියාමාර්ග හරහාද මෙම සේවාවන් වල ඉල්ලුම වැඩි වීමට හේතු වී ඇත. එසේම දැනට සීඝ්‍ර වර්ධනයක් අත්පත් කර ගනිමින් තිබෙන උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වල පුහුණු වෙළඳපොළ අවශ්‍යතාවයන් සැපිරීමද සිදුකිරීමේ අවකාශය ඇත .

- **සම්පූර්ණ වී නොමැති අවශ්‍යතා**

  ක්ෂේත්‍රය සඳහා සේවා සපයන්නන් විසින් සම්පූර්ණ නොකරන ලද අවශ්‍යතා තවමත් ඇත .මේ යටතේ ක්‍රමවත් මැණික් නිධි ගවේශණ ,ප්‍රාථමික මැණික් නිධි හඳුනාගැනීම ,නිධි ලබා ගැනීමේ තාක්ෂණය ඉහළනැංවීම සහ සමස්ථයක් ලෙස ප්‍රමාණාත්මකව නවීන තාක්ෂණය කර්මාන්තයට සම්ප්‍රේෂණය වීම මන්දගාමී තත්වයක් ඇත.

- **තාක්ෂණික අභිවර්ධනය**

  මැණික් නිධි කැණීම සහ මැණික් වල වර්ණය වැඩි දියුණු කිරීම වැනි කටයුතු සඳහා නව යන්ත්‍රෝපකරණ සොයා ගැනීම සහ හඳුන්වාදීම සඳහා ද ඉඩ ප්‍රස්ථාවක් ඇත .

- **ආයතනයේ දියුණුව**

  ලෝකයේ විවිධ ප්‍රදේශ වල සේවා ලාභීන් සඳහා සේවය ලබා දීමට ආසියානු පැසිපික් කලාපයේ මැණික් හා ස්වර්ණාභරණ පිළිබඳ උපාධි පාඨමාලාවන් පිරිනැමීමට හැකි පරිදි මෙම ආයතනය උසස් කිරීමේ අවශ්‍යතාවය ද ඇත.

- **වෙනත් පහසුකම්**

  ගෙවුඩ තාප පිරියම් කිරීමේ මධ්‍යස්ථාන ශ්‍රී ලංකාවේ වෙනත් ස්ථාන වල ස්ථාන ගත කිරීම සහ පර්යේෂණ පහසුකම් මහින්ද මෙම ක්ෂේත්‍රය වෙනුවෙන් විශාල සේවාවන් ලබා දීම සඳහා අවස්ථාවන් ඇත.

- **කර්මාන්තයේ දියුණුව සඳහා සංධිය වැඩසටහන්**

  මධ්‍යම පරිසර අධිකාරිය සමග මැණික් කර්මාන්තය සඳහා පරිසර හිතකාමී ක්‍රම සඳහා අනුබල දීමද , ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමග පර්යේෂණ ව්‍යාපෘති සඳහා ද ,වෙනත් රාජ්‍ය ආයතන සමග විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා ද සහසම්බන්ධ වෙමින් කටයුතු කිරීමේ අවස්ථාවන් ඇත .

- **ප්‍රචාරක වැඩසටහන්**

ආයතනයේ සේවාවන් පිළිබඳ මහජනතාව වෙත ප්‍රචාරණය කිරීමේ වැඩසටහන් දියත් කිරීමේ හැකියාව ඇත. මේ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ,මැණික් හා ස්වර්ණාභරණ සඟරා, පත්‍රිකා සහ ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් ආදිය සඳහා අවස්ථාවන් ඇත.

## 3.2. අභියෝග

- **යටිතල පහසුකම්**

  නවීන උපාංග හා යන්ත්‍රෝපකරණ පුහුණු ඒකක වලට හඳුන්වා දී ඒ හරහා කර්මාන්තයෙහි ප්‍රගමනයට අවශ්‍ය පුහුණුව, දැනුම හා කුසලතාවය ලබා දීමට කඩිනම් පියවර ගත යුතුව ඇත. ස්වර්ණාභරණ පුහුණු ඒකක වල මැණික් කැපීමේ ඒකකය හා මැණික් රසායනාගාරය සඳහා ඉතා දියුණු යන්ත්‍ර උපකරණ හඳුන්වා දිය යුතු වේ .තවද ලෝහ ප්‍රමිතිය නිශ්චය කිරීමේ ඒකකයක් ආරම්භ කර ඒ ආශ්‍රිත පාඨමාලා හඳුන්වා දිය යුතුව ඇත .දියමන්ති කැපීම මෙම කර්මාන්තයේ සුවිශේෂී කර්මාන්තයක් වන බැවින් ඒ සඳහා අදාල පුහුණු ඒකකයක් ස්ථාපනය කර දැනුම ලබා දීම හා ඒ ආශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා පියවර ගත යුතුවේ .

- **භෞතික සම්පත්**
  ආයතනයේ පර්යේෂණ හා පුහුණු අංශයේ වැඩකටයුතු ප්‍රසාරණාත්මක මට්ටමකින් කරගෙන යාමට අවශ්‍ය වාහන ඌනතාවයක් දක්නට ඇත. තවද වර්තමාන අවශ්‍යතාවයට සරිලන පරිදි පර්යේෂණාගාර පහසුකම්ද වැඩි දියුණු කිරීමට අවශ්‍යව ඇත.

- **සේවකයන්ගේ දුර්වල ආකල්ප**

  මෑත අතීතයේ සේවකයින් තුල සෘණාත්මක ආකල්පමය මානසික පසු බිමක සිටීම.

- **සහෝදර ආයතන මඟින් අපගේ සේවාවන් ද්විකරණය.**

  උදාහරණ:- අපගේ පුහුණු කටයුතු, රසායනාගාර සේවා ආදිය.

- **මානව සම්පත්**
  කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත සේවක සැලැස්ම අනුව අප ආයතනය සඳහා සේවක සංඛ්‍යාව 136 ක් වන අතර වර්තමානයේ සේවයේ යෙදී සිටින සංඛ්‍යාව 78 ක් වේ. ආයතනයේ පර්යේෂණ හා පුහුණු කාර්ය මණ්ඩලය සඳහා දේශීයව තිබෙන පුහුණු අවස්ථාවන් සීමාසහිත වීම නිසා සහ මෙම ක්ෂේත්‍රයේ විෂය දැනුම සහිතව සිටින නිළධාරීන් සීමිත වීම නිසා පුහුණු අවස්ථාවන් සඳහා යොමු කිරීමට ඇති අවස්ථාවන් අවම වීම නිසා අප කාර්ය මණ්ඩලය වර්තමාන කර්මාන්තයේ ඉල්ලුම සැපිරීමට ප්‍රමාණවත් නොවන බව පෙනීයයි .එය කර්මාන්තයේ අනාගතයට හිතකර නොවන අතරම ආයතනයේ පුහුණු ඉල්ලුම පහලයාමට බලපෑ හැකිය .ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා හැකිතාක් දේශීය හා විදේශීය පුහුණු අවස්ථාවන් ලබා දීමෙන් මෙම තත්වය සඳහා විසඳුම් ලබා ගත හැකි වේ.

- **මූල්‍ය සම්පත්**

  වර්තමාන අවස්ථාවලට අනුව ආයතනයේ වැඩ කටයුතු ප්‍රසාරණාත්මක මට්ටමකින් කරගෙන යාමට ප්‍රමාණවත් අරමුදල් සඳහා මහාභාණ්ඩාගාර දායකත්වය අවම මට්ටමක පවතින අතර ඒ වෙනුවෙන් සුදුසු සෙස් බදු ක්‍රමවේදයක් ද මේ වන විට සැකසී නොමැත.

- **පෞද්ගලික අංශයේ පුහුණු ආයතන බිහි වීම**

  මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ අධ්‍යාපන කටයුතු සඳහා පෞද්ගලික අංශයේ මැදිහත්වීම ක්‍රමයෙන් වර්ධනය වී ඇත.

- **කර්මාන්තයේ සමහර අංශ වල දිරිගැන්වීම් නොතිබීම**

  උදාහරණ -සේවා කැපුම් අංශය

## 4. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

### 4.1. අරමුණු

1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පාර්ලිමේන්තු පනතේ 25(1) වගන්තිය ප්‍රකාරව1995 ජූලි 28 දිනැති හා අංක 882 දරණ ගැසට් නිවේදනය මගින් මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය පිහිටුවන ලදී.ආයතනයේ ප්‍රධාන අරමුණ වන්නේ පර්යේෂණ සහ පුහුණු පහසුකම් හරහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය විධිමත් කිරීම, වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීමයි.

### 4.2. ආයතනයේ බලතල

ශ්‍රී ලංකාවේ මැණික් ඛණිජ හා එම නිධි පිළිබඳව සමීක්ෂණය කිරීම හා ඊට අදාල පහත සඳහන් කරුණු ගැන විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.

1. ශ්‍රී ලංකාවේ මැණික් ඛනිජ පිළිබඳ සමීක්ෂණයන් කිරීම

    (අ) පිහිටීම.
    (ආ) හඳුනා ගැනීම.
    (ඇ) මැණික් ගල් අනර්ගීකරණය කිරීමේ ක්‍රම.
    (ඈ) වෙනත් අදාල ක්ෂේත්‍රයන් හා අදාල රත්න විද්‍යාත්මක පර්යේෂණ කිරීම් .

2. පතල් කැණීම, මැණික් කැපීම, ස්වර්ණාභරණ සැදීම, මැණික් ගල් පිළිස්සීම සඳහා ක්‍රම සහ ස්වර්ණාභරණ තැනීම වැනි ක්ෂේත්‍රයන්හි මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර නිපදවීම ඇතුලත් ශිල්පීය සහ අනෙකුත් උපදෙස් සැපයීම.

3. (අ) මැණික් කැපීම.
    (ආ) ස්වරණාභරණ සැදීම.
    (ඇ) දියමන්ති ඇතුලු රත්න විද්‍යාව.
    (ඈ) ස්වර්ණාභරණ මෝස්තර සකස් කිරීම.
    (ඉ) මැණික් ගල් අනර්ගීකරණය
    (ඊ) මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ වෙනත් අදාළ අංශ පිළිබඳව පුහුණුවක් ලබා දීම.

4. වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීම හා අදාල මාතෘකා හා කරන ලද වැඩ කටයුතු ආදිය පිළිබඳ පත්‍රිකා හා පොත්පත් පල කිරීම.

5. ආයතනයේ කර්තව්‍යයන් නිසි ලෙස ඉටු කිරීම පහසු කිරීමට අවශ්‍ය වෙනත් දෑ කිරීම.



# පුහුණු අංශය

## 4.3 ක්‍රියාකාරකම් හා කාර්යක්ෂමතාවය

### 4.3.1. පුහුණු අංශය

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය උපායමාර්ගික සංවර්ධනයක් කරා මෙහෙයවීමට හැකියාව ඇති නිපුණ ශිල්පින් සහ දැනුමෙන් පිරිපුන් වෘත්තිකයන් ක්ෂේත්‍රයට දායක කිරීම සඳහා පතල් කැනීමේ සිට වෙළඳ පොළ දක්වා වූ සංකල්පය ඔස්සේ පුහුණු පාඨමාලා සහ අනෙකුත් සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පුහුණු අංශයේ මූලික අරමුණ වේ.මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම තුලින්,

- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ කාර්යක්ෂමතාව සහ කාර්ය සාධනය වැඩි කිරීම
- ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව ඉහල නිෂ්පාදන ඇති කිරීම තුලින් කර්මාන්තයේ පිළිගැනීම වැඩි කිරීම
- නිෂ්පාදන විවිධාංගීකරණය තුලින් වෙළඳපොල අවස්ථා ඉහල නැංවීම
- කර්මාන්තයේ මෙහෙයුම් වේගවත් කිරීම තුළින් ආදායම් උත්පාදනය සහ රැකියා අවස්ථා වැඩි කිරීම සිදු කෙරේ.

මේ සඳහා පුහුණු අංශය විසින් 2021 වසරේදී පහත වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

**1. වෘත්තිය අධ්‍යාපනය ඉලක්ක කර ගත් පුහුණු පාඨමාලා මෙහෙයවීමට කටයුතු කිරීම.**

මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිපුණ ශිල්පින් සහ වෘත්තීය වේදීන් ඇතිකිරීමේ අරමුණින් සහතික පත් පාඨමාලා,ජාතික වෘත්තිය සුදුසකම සහිත පාඨමාලා සහ ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලා රැසක් මෙහෙයවීමට කටයුතු කර ඇත. අනපේක්ෂිත පරිදි ඇතිවූ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් වසරේ වැඩි කාලයක් රට වසා දැමීමට සිදු වීම හේතුවෙන් ආයතනයේ කාර්යය භාරයන් විධිමත් අයුරින් ක්‍රියාත්මක කර ගෙන යාමට නොහැකි වීම මත 2021 වසරේ ආරම්භයේදී සැලසුම් කල පුහුණු වැඩසටහන් වසර මැදදී නැවත වරක් සංශෝධනය කිරීමට සිදුවිය .ඒ අනුව ඉලක්කගත ශීෂ්‍ය බදවා ගැනීම් සංඛ්‍යාව 265 වැනි අගයකට සංශෝධනය කිරීමට සිදුවූ අතර ලබා ගත් ප්‍රගතිය (සිසුන් 286) ඒ අනුව අනෙකුත් වසර වලට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු වී ඇත.එමෙන්ම 2019 හා 2020 වසර වල අවසන් නොකරන ලද පාඨමාලා සඳහා සහභාගි වූ සිසුන් 337 දෙනෙක් අධ්‍යයන කටයුතු 2021 වසර තුළදීත් අඛණ්ඩව පවත්වාගෙන යාමට සිදුවිය.

| මැණික් ක්ෂේත්‍රයේ පාඨමාලා | ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ පාඨමාලා |
|---|---|
| රත්න විද්‍යාව ඩිප්ලෝමාව (Dip. PGSL) | ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය හා නිෂ්පාදන තාක්ෂණ ඩිප්ලෝමාව (Dip. PJSL) |
| මූලික රත්න විද්‍යාව (සහතික පත්‍ර පාඨමාලාව) | ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය (සහතික පත්‍ර පාඨමාලාව) |
| රත්න විද්‍යාව (සහතික පත්‍ර පාඨමාලාව) | පරිගණක ආශ්‍රිත ස්වර්ණාභරණ මොස්තර නිර්මාණය (සහතික පත්‍ර පාඨමාලාව) |
| ගෙවුඩ තාප පිරියම්කරණය (සහතික පත්‍ර පාඨමාලාව) | ස්වර්ණාභරණ නිෂ්පාදනය (NVQ 03/04) පාඨමාලාව |
| මැණික් කැපීම හා ඔප දැමීම (NVQ 03/04) පාඨමාලාව | විලාසිතා ආභරණ නිෂ්පාදනය (සහතික පත්‍ර පාඨමාලාව) |
| මැණික් වර්ණශ්‍රේණිගත කිරීම හා අලෙවිකරණය (සහතික පත්‍ර පාඨමාලාව) | ආභරණ සඳහා ගල් බැඳීම (NVQ 03) (සහතික පත්‍ර පාඨමාලාව) |

වගුව I - 2021 වසරේ ක්‍රියාත්මක කරන ලද පුහුණු පාඨමාලා

මෙම වර්ෂය තුල කෝවිඩ් වසංගත තත්වය හමුවේ වුවද සිසුන් 286 දෙනෙකු වැනි සංඛ්‍යාවක් පාඨමාලා සඳහා බඳවා ගැනීමට හැකි වී ඇත.

| පාඨමාලාව | බඳවාගත් සිසුන් සංඛ්‍යාව |
|---|---|
| ඩිප්ලෝමා පාඨමාලා | 12 |
| රත්න විද්‍යා සහතික පත්‍ර පාඨමාලා | 136 |
| ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සහතික පත්‍ර පාඨමාලා | 87 |
| 2021 වසරේ මුළු සිසුන් ගණන | 286 |
| 2019,2020 වසර වලින් 2021 වසර සඳහා සම්බන්ධවන සිසුන් ගණන | 337 |

**වගුව II - 2021 වසරේ පුහුණු පාඨමාලා සඳහා බඳවා ගැනීම්**

### 1.1 සිසුන් බඳවා ගැනීමේ ප්‍රගතිය




| වසර | බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| 2014 | 540 |
| 2015 | 674 |
| 2016 | 757 |
| 2017 | 1200 |
| 2018 | 1220 |
| 2019 | 1165 |
| 2020 | 465 |
| 2021 | 286 |

**පුහුණු පාඨමාලා සඳහා බඳවා ගත් සිසුන්ගේ වර්ධනය**

### 1.2 පාඨමාලා නිම කල සිසුන්ගේ ප්‍රගතිය

මෙහිදී 2021 වසරේ බඳවා ගත් සිසුන්ගෙන් සහ 2019,2020 වසරවල බඳවා ගත් නමුත් 2021 වසරේදීත් අධ්‍යයන කටයුතු සිදු කර අවසන් පරීක්ෂණය 2021 වසරේදී සිදු කරන ලද මුළු සිසුන් ගණන 217 කි.

| වර්ෂය | පාඨමාලා නිම කල සිසුන් සංඛ්‍යාව |
|---|---|
| 2014 | 370 |
| 2015 | 550 |
| 2016 | 596 |
| 2017 | 768 |
| 2018 | 783 |
| 2019 | 669 |




| | |
|---|---|
| 2020 | 221 |
| 2021 | 217 |

පුහුණු පාඨමාලා අවසන් කල සිසුන්ගේ ප්‍රගතිය

**1.3** ආදායම් උත්පාදනය කිරීමේ ප්‍රගතිය




| වර්ෂය | ආදායම රු (මී) |
|---|---|
| 2014 | 7.12 |
| 2015 | 6.42 |
| 2016 | 9.68 |
| 2017 | 8.26 |
| 2018 | 11.72 |
| 2019 | 13.06 |
| 2020 | 8.2 |
| 2021 | 3.3 |

පාඨමාලා ආදායම් ඉපයීමේ වර්ධනය

**1.4 දිපව්‍යාප්තව පාඨමාලා මෙහෙයවීම සඳහා මධ්‍යස්ථාන සැළසුම් කිරීම**

මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අවශ්‍ය වන්නා වූ නිපුණ ශිල්පීන් හන්වා දීම සඳහා දිවයිනම ආවරණය වන අයුරින් පුහුණු පාඨමාලා මෙහෙයවීම සඳහා 2021 වසරේදී ආයතනය විසින් කඩුවෙල ප්‍රධාන කාර්යාලය ද ඇතුලුව පුහුණු මධ්‍යස්ථාන 08 ක් සාර්ථකව ක්‍රියාත්මක කරගෙන යනු ලැබිණි. එම පුහුණු මධ්‍යස්ථාන පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| 01. කොළඹ | 02. රත්නපුර | 03. මහනුවර |
| 04. ගාල්ල | 05. අවිස්සාවේල්ල | 06. නාවුල |
| 07. යාපනය | 08. මඩකලපුව | |

**2.** අධ්‍යාපනික සංවර්ධන වැඩසටහන්

**2.1** තත්ත්ව කළමණාකරණ පද්ධතිය (QMS) ස්ථාපිත කිරීම

පාඨමාලා වල හා ආයතනයේ ගුණාත්මකභාවය සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) ප්‍රමිතීන්ට අනුකූලව තත්ත්ව කළමණාකරණ පද්ධතිය (QMS) ස්ථාපිත කිරීමේ කටයුතු 2020 වසරේ ආරම්භ කරන ලද අතර ආයතනය තුල එම ප්‍රමිතියන්ට අනුකූලව තත්ත්ව ප්‍රතිපත්ති අත්පොත, ක්‍රියාවලිය සහ ක්‍රියා පටිපාටි අත්පොත, රීති සහ නියාමන කේතය, ISO 9001: 2008 සහ IWAZ: 2007 තත්ත්ව සහතික කිරීම සඳහා අනුපූරක ලේඛන ලෙස තබා ගන්නා වාර්තා වැනි ලිඛිත අත්පොත් සංවර්ධනය කිරීම මෙම වසර තුලදී අවසන් කරන ලදී.මේ සඳහා විශේෂඥ දැනුම සහිත උපදේශකවරයකුගේ සේවය සපයා ගන්න ලද අතර 2022 වසරේදී මෙය ස්ථාපනය කර පවත්වාගෙන යාමේ හැකියාව පවතී. මෙම සමස්ත තත්ත්ව කළමනාකරණ ප්‍රවේශය මඟින් අධ්‍යයන කටයුතුවලදී අපගේ ක්‍රියාකාරකම් වල ගුණාත්මකභාවය සහතික කෙරේ.

### 2.2 ජාතික වෘත්තීය සුදුසුකම් සහිත පුහුණු පාඨමාලා ප්‍රමිති මට්ටම් ගොඩනැගීම

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල නිෂ්පාදන වෙළඳපොළ පදනම් කොට ගෙන ඒ ආශ්‍රිතව දැනට පවතින සහ අවශ්‍ය රැකියා අවස්ථා පිළිබඳ හඳුනා ගැනීම සහ ඒ ආශ්‍රයෙන් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හරහා රත්න විද්‍යාව සහ ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය පුහුණු පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් නිපුණතා මට්ටම් (NVQ) ගොඩනගා ගැනීමට අදාල මූලික කටයුතු ක්‍රියාත්මක කර ඇත.මෙහෙදී රත්න විද්‍යාව සඳහා NVQ L 4, 5 සැකසීමටත් ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය සඳහා NVQ L 4 සැකසීමටත් අවශ්‍ය කටයුතු මේ වන විට ජාතික ආධුනිකත්ව මණ්ඩලය විසින් පත් කරගනු ලබන කමිටුවක් මඟින් සිදු කෙරෙමින් පවතී.

### 2.3 විෂය මාලා සමාලෝචනය , නව විෂය මාලා සංවර්ධනය , පාඨමාලා නිබන්දන සහ සටහන් සහිත ආයතනික පොත් මුද්‍රණය කිරීම

ආයතනය විසින් කාලිනව දේශිය හා විදේශිය වශයෙන් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය තුල හා නිෂ්පාදන වෙළඳපොළ තුල ඇති වන්නා වූ විවිද ධනාත්මක වෙනස්කම් පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වනු ලබන අතර ඒ ආශ්‍රිතව නිරන්තරව ආයතනයේ පුහුණු පාඨමාලා සැළසුම් කිරීමටත් විෂයය නිර්දේශ සංශෝධනය කිරීමටත් නවීන තාක්ෂණානුකූලව පුහුණු පාඨමාලා මෙහෙයවීමටත් අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. 2021 වසරේ පැවති සංචරන සීමා කාලය තුලදී ආයතනයේ පුහුණු අධ්‍යයන කාර්යය මණ්ඩලය හරහා අංශය ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන පුහුණු පාඨමාලාවන්ට අවශ්‍ය කරනු ලබන පාඨමාලා නිබන්ධන සහ සටහන් ඇතුලත් පොත් සකස් කිරීමේ කටයුතු සිදු කරනු ලැබිණි. ඒ අනුව 2021 වසරේදී ගෙවුඩතාප පිරියම් කිරීම , මැණික් කැපීම සහ ඔප දැමීම , ස්වර්ණාභරණ නිෂ්පාදනය යන පාඨමාලා සඳහා මෙම ග්‍රන්ථ සකස් කිරීමටත් මුද්‍රණය කිරීමටත් කටයුතු කර ඇත.

### 3. ශිෂ්‍ය සහතික පත් ප්‍රධානෝත්සවය

ආයතනය විසින් මේ වන විට ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටමට (NVQ Levels) අනුකූලව සහ ඩිප්ලෝමා මට්ටමින් පුහුණු පාඨමාලා මෙහෙයවනු ලැබේ. මෙම පාඨමාලා සම්පූර්ණ කරනු ලබන පුහුණු ලාභීන් සඳහා ආයතනය තුල ප්‍රථම වරට උසස් අන්දමින් සහතික පත්‍ර ප්‍රදානෝත්සවයක් පැවැත්වීමට 2021 වසරේ සැළසුම් කරනු ලැබිණි. නමුත් උද්ගත වූ වසංගත තත්ත්වය අනුව පවතින නීති රීතින්ට අනුගතව මෙම වැඩසටහන

ආයතනය අපේක්ෂා කරනු ලබන අයුරින් ගුණාත්මකව පැවැත්වීමට නොහැකි විය. නමුත් මෙම වැඩසටහන 2022 වසරේදී පැවැත්වීමට සැලසුම් කර ඇත.

**4. ශිෂ්‍ය වෘත්තීය මාර්ගෝපදේශණය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය**

අප ආයතනයේ මැණික් කැටයම් කැපීම හා විලාසිත අභරණ නිෂ්පාදනය පාඨමාලා සාර්ථකව අවසන් කර ව්‍යවසායකයින් ලෙස සංවර්ධනය වීමට කැමැත්තක් දක්වන සිසුන් 10 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම මෙමගින් සිදු කෙරේ.මෙහිදී ව්‍යාපාර කටයුතු ක්‍රියාත්මක කිරීමට යන්ත්‍රෝපකරණ ලබාගැනීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාගැනීම, ව්‍යාපාර සැලැස්ම සැකසීම ,වෙළඳපොල ප්‍රවිෂ්ට වීම,අලෙවිකරණය සඳහා අවශ්‍ය දැනුම ලබාදීමටත් අවශ්‍ය සියලු කටයුතු සම්බන්ධීකරණය කිරීම අප ආයතනය මගින් සිදු කරන ලදී.සිසුන් සඳහා මෙහි පළමු වැඩමුළුව කර්මාන්ත සංවර්ධන මණ්ඩලය විසින් 2022 වර්ෂයේ පෙබරවාරි මස ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

**බාහිර පුහුණු වැඩසටහන් සඳහා සේවක සහභාගීත්වය - 2021**

දේශීය පුහුණු වැඩසටහන්

| | පුහුණු මධ්‍යස්ථාන | පුහුණු වැඩසටහනේ නම | සහභාගිවන්නන් |
|---|---|---|---|
| 1 | ශ්‍රී ලංකා භූ විද්‍යා ආයතනය (IGSL) | භූ විද්‍යාත්මක ගවේෂණ කටයුතු සඳහා ගෝලීය සංචාලන චන්ද්‍රිකා පද්ධති නිවැරදිව ස්ථානගත කිරීම. | 1. ආර්.එම්.එන්.පී.කේ ජයසිංහ මයා {අධ්‍යක්ෂ (පර්යේෂණ) වැ.බ}<br>2. එම්.කේ.සී. ජයමාලි මිය (පර්යේෂණ නිළධාරී) |
| 2 | නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) | සංවර්ධන නිළධාරීන්ගේ හා කළමණාකරණ සහකාරවරුන්ගේ වෘත්තීය සංවර්ධනය | 1. බී.ජී.අයි.පී. සමරදාස මිය (කළමනාකරණ සහකාර)<br>2. එම්.පී.බී.එච්. හේමවන්ද්‍ර මෙය (කළමනාකරණ සහකාර)<br>3. එස්.කේ. විතානගේ මිය (කළමනාකරණ සහකාර)<br>4. පී.ඒ.කේ.එන්. පෙරේරා මිය (කළමනාකරණ සහකාර)<br>5. යූ.ඒ.ඩී. රූපසිංහ මිය (කළමනාකරණ සහකාර)<br>6. කේ.වී.කේ. කුමාර මයා (කළමනාකරණ සහකාර)<br>7. අයි.ඩී.එන්. ප්‍රියංජිකා මිය (කළමනාකරණ සහකාර) |
| 3 | නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) | රාජ්‍ය ආයතන වල විගණන විමසුම් අවම කර ගන්නේ කෙසේද? | 1. එන්.සී. විජේසිංහ මිය (සහකාර අධ්‍යක්ෂ-විෂයමාලා)<br>2. ජේ.එච්.අයි.එස්. ජයමහ මිය (සහකාර අධ්‍යක්ෂ-විෂයමාලා)<br>3. එස්. විජේවර්ධන මිය (පර්යේෂණ නිළධාරී) |

| | | | |
|---|---|---|---|
| | | | 4. එම්.කේ.සී. ජයමාලි මිය (පර්යේෂණ නිළධාරී)<br>5. නදීකා මන්ත්‍රීරත්න මෙය (පර්යේෂණ නිළධාරී)<br>6. රංගි සෙනෙවිරත්න මෙය (වැඩසටහන් නිළධාරී)<br>7. රංගිකා ලක්ෂාන්ති මිය (GIS සහායක)<br>8. එච්.ඒ.එන්. ප්‍රියදර්ශනී මිය (අභ්‍යන්තර විගණක)<br>9. එච්.එම්.එන්.එන්.කේ විජේරත්න මෙය (විගණන සහකාර)<br>10. යූ.ඒ.ඩී. රූපසිංහ මිය (කළමනාකරණ සහකාර)<br>11. බී.ජී.අයි.පී. සමරදාස මිය (කළමනාකරණ සහකාර)<br>12. එම්.පී.බී.එච්. හේමචන්ද්‍ර මෙය (කළමනාකරණ සහකාර)<br>13. එස්.කේ. විතානගේ මිය (කළමනාකරණ සහකාර)<br>14. පී.ඒ.කේ.එන්. පෙරේරා මිය (කළමනාකරණ සහකාර)<br>15. කේ.ඒ.එන්.ඊ. රුද්‍රිගු මෙය (කළමනාකරණ සහකාර) |


පර්යේෂණ අංශය
5x

## පර්යේෂණ අංශය

### 1. ව්‍යාපෘතිය :- ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව

මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ පවතින මැණික් තැම්පතු ජාතික ආර්ථිකයට දායක කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක වේ. එහිදී එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළව මැණික් විභව සිතියම් හා සවිස්තරාත්මක වාර්තා ඉදිරිපත් කරනු ලැබේ.

#### 1.1 ගැටහැත්ත සහ මාරඹේ අවට මැණික් තැම්පතු

විශේෂිත මැණික් නිධි පිහිටීමක් වන ගැටහැත්ත ආග්නේය මැණික් නිධිය (Getaheththa Igneous gem occurrence), ගැටහැත්ත හා මාරඹේ ප්‍රදේශ ආශ්‍රිතව දක්නට ඇත.(රූපය 1)



*රූපය 1- ගැටහැත්ත ආග්නේය මැණික් නිධියෙන් ලබාගත් කුරුවින්ද මැණික් ස්ඵටික අන්තර්ගත වීමේ සම්භාවිතාව සහිත ගෙඩි ආකාර පාෂාණයක්*

මේ පිළිබඳව කළ අධ්‍යනයේ දී ද්විතියික මැණික් නිධි ද පවතින බවට හඳුනාගන්නා ලද අතර ඒවා ගැටහැති ඔය හා කළු ගඟේ පිටාර තැනි (Flood plains) ආශ්‍රිතව පිහිටා ඇත. (රූපය 2)




*රූපය 2- ඇහැළියගොඩ කිරිපෝරුව ප්‍රදේශයේ පිහිටන මැණික් තැම්පතුවක සිරස්කඩක්*

### 1.2 නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැණික් විභවතාව සිතියම්ගත කිරීම

ගාල්ල දිස්ත්‍රික්කයේ නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික අධ්‍යනයන් හරහා මැණික් හමුවීමේ සම්භාවිතාවයක් සහිත ප්‍රදේශ හඳුනාගන්නා ලදී. එම නිරීක්ෂණයන්, භූ විද්‍යාත්මක සිතියම් හා භූ රූපීය ලක්ෂණ පදනම් කරගනිමින් පිළියෙළ කරන ලද මූලික මැණික් විභව සිතියම රූපය 3 මඟින් දැක්වේ.




*රූපය 3: නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි මැණික් විභවය පිළිබඳ මූලික සිතියම*

COVID 19 වසංගත තත්ත්වය හමුවේ සංචරණ සීමා පැවතීම හේතුවෙන් සැලසුම් කළ පරිදි ක්ෂේත්‍ර ගවේෂණ සිදු කිරීමට නොහැකි වූ බැවින් නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළ අවසන් මැණික් විභව සිතියම හා තාක්ෂණික වාර්තාව 2022 වර්ෂයේ නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

### 1.3 කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැණික් විභවතාව සිතියම්ගත කිරීම

2021 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්ෂේත්‍ර සාම්පල ද ලබාගැනීම සිදුකරන ලදී. ඒ සඳහා මූලික මැණික් විභව සිතියමක්ද ලබාගත් දත්ත ඇසුරින් සකසන ලදී (රූපය 4).




*රූපය 4 - කුරුවිට කොට්ඨාසයේ මූලික මැණික් විභව සිතියම*

කෙසේ වුවද කුරුවිට කොට්ඨාසය මේ වන විටද අධික ව පතල් කැපීමට බඳුන් වූ ප්‍රදේශයක් නිසා රත්නපුර දිස්ත්‍රික්කයේම කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ප්‍රමුඛතාව ලබාදීමට වර්ෂාවසානයේ තීරණය කෙරිණ. ඒ අනුව කිරිඇල්ල කොට්ඨාසයේ උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මූලික අධ්‍යයනයන් සිදු කරන ලදුව මැණික් පිහිටීමේ සම්භාවිතාවයක් සහිත ප්‍රදේශ හඳුනාගන්නා ලදී. ඒ අනුව කිරිඇල්ල කොට්ඨාසයට අදාළ මැණික් විභව සිතියම් හා තාක්ෂණික වාර්තාව 2022 වර්ෂාවසානයේ නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

### 1.4 හඳුනාගත් මැණික් විභව ඉඩම් මැණික් කැණීම් සඳහා යොමු කිරීම

මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හා සම්බන්ධව පතල් කැණීම් සඳහා නියමු වැඩසටහන් පැවැත්වීමට කටයුතු සලසන ලදී.

ඒ වෙනුවෙන් හඳුනා ගත් මැණික් විභව ඉඩම් (රජයේ සහ පෞද්ගලික ඉඩම් ඇතුළු ඉඩම් 50ක පමණ) ලැයිස්තුවක් නියමු පතල් කැණීම් හරහා තහවුරු කර ගැනීම සහ මැණික් කැණීම් බලපත්‍ර නිකුත් කිරීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත යොමු කර ඇත.




*රූපය 5*

**2. <u>ව්‍යාපෘතිය :- මැණික් කැණීම් සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ සැකසීම</u>**

මෙම ව්‍යාපෘතිය ඔස්සේ විවිධ මැණික් කැණීම් ක්‍රම නිසා පරිසරයේ විවිධ ස්ථර වලට සිදුවන හානි හඳුනාගත් අතර ඊට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ මැණික් කැණීමෙන් පසු භූමි ප්‍රතිස්ථාපනය නිසි පරිදි සිදුනොවීම බව හඳුනාගන්නා ලදී. ඒ අනුව ව්‍යාපෘතිය පිළිබඳ මූලික වාර්තාවක් සකස් කර ඇති අතර මැණික් කර්මාන්තය සඳහා සුදුසු භූමි ප්‍රතිස්ථාපන ක්‍රමවේද, අවසන් භූමි පාරිභෝජනය (End Land use) සිදු කරන ආකාරය ඇතුළත් මාර්ගෝපදේශ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ හා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙහි සහයෝගය සහිතව 2022 වර්ෂයේ අවසන් කිරීමට අපේක්ෂිතය.


Gem mining practices in Sri Lanka and the environmental damage caused by gem mining

GJRTI

Gem and Jewellery Research and Training Institute

State Ministry of Gem and Jewellery Related Industries

May 2021

*රූපය 6 - මැණික් ගැරීම නිසා සිදුවන පරිසර හානිය පිළිබඳ වාර්තාව*

3. <u>ව්‍යාපෘතිය :- අඩු තත්වයෙන් යුතු මැණික් සඳහා අගය එකතු කිරීමේ නව තාක්ෂණික ක්‍රමවේද හඳුන්වාදීම</u>

මෙම ව්‍යාපෘතිය යටතේ විදුලි උදුන භාවිතයෙන් යං ගෙවුඩ සඳහා සිදුකරනු ලබන තාප පිරියම් ප්‍රශස්ථ තත්ව හඳුනා ගැනීමේ අධ්‍යයන කටයුතු තවදුරටත් සිදු කෙරිණි. එහිදී පැය 100 ක් දක්වා රික්ත නළ තත්ව යටතේ සිදුකළ අධ්‍යයන කටයුතු මඟින් සාර්ථක ප්‍රතිඵල අත්කරගත හැකිවිය.



*රූපය 7- සිරස් නළ උදුන මඟින් තාප පිරියම් පර්යේෂණ සිදුකිරීම*

### 3.1 අඳුරු පැහැ කිරිංචි සඳහා අගය එකතු කිරීම

අර්ධ අගනා මැණික් විශේෂයක් වන කිරිංචි සඳහා මේ වන විට මැණික් වෙළඳපල තුල විශාල ඉල්ලුමක් ලැබී ඇත. ශ්‍රී ලංකාවේ මැණික් පතල් ආශ්‍රිතව අඳුරු පැහැ කිරිංචි බහුලව හමුවන අතර මෙම අඳුරු පැහැ කිරිංචි වල පාරදෘෂ්‍යතාව වැඩිකර ගැනීම මඟින් ඉහළ වටිනාකමක් ලබා ගත හැක. එම අරමුණු සහිතව සුදුසු තාප පිරියම් තත්ව හඳුනාගැනීම සඳහා මෙම අධ්‍යනය 2021 වසර තුලදී ක්‍රියාත්මක කෙරිණි.

රත්නපුර ප්‍රදේශයෙන් එක් රැස් කරගත් අඳුරු කිරිංචි නිදර්ශක සඳහා 600$^0$C ත් 1800$^0$C අතර වූ උෂ්ණත්ව පරාසයක් තුළ ඔක්සිහාරක හා ඔක්සිකාරක කුටීර වායුගෝලීය තත්වය යටතේ ලක්මිණි වායු උදුන භාවිතයෙන් තාප පිරියම් පර්යේෂණ සිදු කෙරිණි. එමඟින් හඳුනාගත් පරිදි 1050$^0$C ක පමණ උෂ්ණත්වය පිරියම් කිරීම සඳහා ප්‍රශස්ථ උෂ්ණත්වය ලෙස හඳුනා ගැනිණ. අඳුරු පැහැ කිරිංචි වල බහුලව Fe හා Zn මූලද්‍රව්‍ය අන්තර්ගත බවත් වැඩිපුර Mn, Cr, හා Cu අඩංගු අඳුරු කිරිංචි වල පිරියම් කිරීම මඟින් පැහැදිලි බව වැඩිවීමේ වැඩි ප්‍රවණතාවයක් පවතින බවත් නිරීක්ෂණය විය.




*රූපය 8- අඳුරු පැහැ කිරිංචි තාප පිරියම්කරණයට පෙර හා පසු*

### 3.2 මැණික් තාප පිරියම් කිරීමේ උදුන නවීකරණය

මැණික් තාප පිරියම් කිරීම සඳහා භාවිතා කරන වායු උදුනේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම වෙනුවෙන් නව වැඩිදියුණු කිරීමේ ක්‍රමවේදයක් ගොඩනඟන ලදී.මෙය වාණිජකරනය කිරීම පිණිස උදුන නිපදවූ ආයතනය සමඟ කටයුතු කරමින් සිටිමි.

4. **<u>ව්‍යාපෘතිය :- ශ්‍රී ලංකාවේ හමුවන අර්ධ මැණික්වල වර්ණය හා පැහැදිලි බව වැඩි කිරීමේ සළුලදායී හා කාර්යක්ෂම ක්‍රම හඳුන්වාදීමේ ව්‍යාපෘතිය (ජාතික විද්‍යා පදනම හි අරමුදල් මඟින් ක්‍රියාත්මක)</u>**

මෙම ව්‍යාපෘතිය 2021 වර්ෂයේ දී අවසන් කරන ලදී. එහි අවසන් වාර්තාවේ මෘදු පිටපත් සහිත සංයුක්ත තැටි දෙකක් ජාතික විද්‍යා පදනමට ඉදිරිපත් කරන ලදී. එසේම හන්තාන මූලික ජාතික විද්‍යායතනය මඟින් පවත්වනු ලැබූ ජාත්‍යන්තර විද්‍යා ප්‍රකාශන සමුළුවේදී මෙම ව්‍යාපෘතියට අදාල පර්යේෂණ පත්‍රිකාව ප්‍රකාශයට පත් කරන ලද අතර ශ්‍රී ලංකා භූ විද්‍යා සංගමයට සම්පූර්ණ පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.




*රූපය 9- අවසන් වාර්තාවේ මුල්පිටුව*

5. **<u>ව්‍යාපෘතිය :- ශ්‍රී ලංකාවේ ස්වර්ණාභරණ නිෂ්පාදන ශිල්පීන් අපද්‍රව්‍ය මඟින් රත්‍රං නිස්සාරණයේදී රසදිය භාවිතය පිළිබඳ අධ්‍යයනය.</u>**

මෙම ව්‍යාපෘතිය අදියර තුනක් යටතේ ක්‍රියාත්මක වන අතර පරිසර අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් හා එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන අරමුදලේ (UNIDO) හා ගෝලීය පරිසර අරමුදලේ මූල්‍ය දායකත්වයෙන් අප ආයතනය හරහා සිදු කරනු ලබයි.
මෙහි දෙවන අදියර ලෙස අපද්‍රව්‍ය මඟින් රත්‍රං නිස්සාරණය සඳහා රසදිය වෙනුවට විකල්ප ක්‍රමවේදයන් ස්වර්ණාභරණ නිෂ්පාදන කර්මාන්තයට හඳුන්වාදීම 2021 වසරේ ආරම්භ කරන ලදී.
මේ අනුව විකල්ප ක්‍රමවේද තුනක් පර්යේෂණාගාර මට්ටමින් හඳුනාගෙන ඇති අතර ස්වර්ණාභරණ නිෂ්පාදන කර්මාන්තය තුල එහි භාවිතය පිළිබඳ අධ්‍යයන කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.

- රාජ අම්ලය (Aqua- Ragia) මඟින් රත්‍රං වෙන් කර ගැනීම.
- සෝඩියම් හයිපොක්ලෝරයිඩ් (Sodium hypochlorite) මඟින් රත්‍රන් වෙන් කර ගැනීම.
- සියඹලා ද්‍රාවණයක් යොදාගනිමින් රත්‍රං නිස්සාරණය.

රාජ අම්ලය මඟින් රත්‍රං වෙන්කර ගැනීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය හා රසදිය මඟින් රත්‍රං වෙන්කර ගැනීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව එක හා සමාන බව හඳුනාගන්නා ලදී. නමුත් රාජ අම්ලය මඟින් රත්‍රන් වෙන්කර

ගැනීමේදී නයිට්‍රජන් ඩයොක්සයිඩ් ($NO_2$) වායුව පිටවන අතර එය විෂ සහිත වායුවක් වන බැවින් වෙනත් රත්‍ර වෙන්කර ගැනීමේ ක්‍රියාවලියක් පිළිබඳ අධ්‍යයනය කරමින් පවතී.
මෙහිදී නව ක්‍රම දෙකක් පිළිබඳ පර්යේෂණාගාර මට්ටමේ අධ්‍යයන කටයුතු සිදුවෙමින් පවතී.




*රූපය 10- රාජ අම්ලය මඟින් රත්‍ර වෙන්කර ගැනීම*

ස්වර්ණාභරණ නිෂ්පාදන ශිල්පීන් රසදිය විෂ වීම පිළිබඳ දැනුවත් කිරීම හා එම ශිල්පීන් රසදිය භාවිතයේදී අනුගමනය කලයුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම වෙනුවෙන් පෝස්ටර් දෙකක් නිර්මාණය කර මුද්‍රණය කිරීමද සිදු කර ඇත.

**6.** <u>ව්‍යාපෘතිය :-</u> වැඩමුළු

බේරුවල ප්‍රදේශයේ ගෙවුඩ තාප පිරියම් කිරීමේ තාක්ෂණික වැඩමුළු දෙකක් 2021.11.02 සිට 2021.11.04 දක්වා සහ 2021.11.06 සිට 2021.11.08 දක්වා පැවැත්විය.



*රූපය 11- බේරුවල ප්‍රදේශයේ පැවැත්වූ ගෙවුඩ තාප පිරියම් කිරීමේ තාක්ෂණික වැඩමුළු*

7. <u>ව්‍යාපෘතිය :- තාක්ෂණික සේවා ලබා දීම</u>

**පුද්ගලික ඉඩම් සඳහා මැණික් නිධි සමීක්ෂණ සේවා ලබා දීම**

ඇහැළියගොඩ කිරිපෝරුව ප්‍රදේශයේ ඉඩමක් වෙනුවෙන් ලද ඉල්ලීමකට අනුව එක් සමීක්ෂණයක් සිදු කරන ලද අතර ඇහැළියගොඩ ගැටහැත්ත, මාරඹේ සහ අවිස්සාවේල්ල ආශ්‍රිතව පවතින ගෙඩි ඉල්ලම් (Gem Corundum Pockets) වල නිශ්චිත පිහිටීම නිර්ණය සඳහා භූ භෞතික සමීක්ෂණයක් (Geological Investigation) සිදු කරන ලදී. (රූපය 12 හා 13).




*රූපය 12 - ඇහැළියගොඩ කිරිපෝරුව, තික්තවැලහේන්යාය ප්‍රදේශයේ අදාළ ඉඩම විද නියැදි ලබාගැනීම සහ නියැදි ලබාගත් ස්ථාන*





*රූපය 13 - ඇහැළියගොඩ සහ අවිස්සාවේල්ල ආශ්‍රිතව පවතින ගෙඩි ඉල්ලම් (Gem Corundum Pockets) සඳහා භූ භෞතික සමීක්ෂණයන් සිදුකිරීම*

**8.** <u>ව්‍යාපෘතිය:- ප්‍රකාශන එළිදැක්වීම</u>

පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශන

1. Samaranayake, K.P.R.N., Balasooriya, N.W.B., **Illangasinghe, S.**, (2021), Value Addition of Sri Lankan Dark Spinels through a Heat Treatment Technique,5th International symposium on Earth Resources Management and Environment, Colombo, Sri Lanka.

2. Raveendrasinghe S.V.T.P., **Jayamali.M.K.C.**,(2021),Geological and Geochemical investigation on Andalusite and chiastolite deposit at Balanthota, Ginigathhena, Sri Lanka, 10th Annual Science Research Session, FAS, South Eastern University of Sri Lanka.

3. **Rifkhan, M.N.M.**, Wewegedara W.G.C.N., Jayasinghe R.M.N.P.K., Dharmaratne T.S., Malaviarachchi M.A.S.P.K, Chndrajith Rohana. 2021. Reddish-Brown Zircons of Sri Lanka; A Detailed Study and Development of a New Technique for Yellow to Golden Yellow Colour Enhancement. (Submitted for the Journal of GSSL)

4. **Rifkhan, M.N.M.**, Wewegedara W.G.C.N., Jayasinghe R.M.N.P.K., Dharmaratne T.S., Malaviarachchi M.A.S.P.K, Chndrajith Rohana. 2021. Colour Enhancement of a Certain Type of Opaque Corundum by Heat Treatment Using a Gas Furnace in proceedings of Young Scientists' Conference on Multidisciplinary Research on October 21, 2021. Pp. 80

**9.** පෝස්ටර ප්‍රකාශන

i. 





*රූපය 14- MINAMATA පිළිබඳ දැනුවත් කිරීමේ පෝස්ටර*

ii. ගෙවුඩ තාප පිරියම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ පෝස්ටරය




*රූපය 15- ගෙවුඩ තාප පිරියම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ පෝස්ටරය*


DEBT
Savings
Deduction
Bills
මූල්‍ය අංශය
69.928
63.772
44.870
48.991
20.556
31.012
26.417
11.311
12.002

## විගණනය කරන ලද පසුගිය අවුරුදු 05 සඳහා වූ මූල්‍ය තොරතුරු

(රු.000)

| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | | | | |
| භාණ්ඩාගාර ප්‍රධාන පුනරාවර්තන | 62,440.0 | 79,854.0 | 85,000.00 | 77,973.00 | 77,060.00 |
| වෙනත් දායක විමි | 38,742.25 | 37,104.7 | 35,622.80 | 29,536.91 | 22,528.16 |
| පාඩමාලා ගාස්තු | 8,318.48 | 10,835.1 | 12,212.03 | 12,409.64 | 3,542.50 |
| සේවා ගාස්තු ආදායම් | 20.0 | 76.5 | 308.0 | 72.5 | 12.00 |
| භූ විද්‍යා පර්යේෂණ සේවාවන්ගෙන් ලැබීම් | | | | | |
| **මුළු මෙහෙයුම් ආදායම්** | **109,520.73** | **127,870.3** | **133,142.83** | **119,992.05** | **103,142.66** |
| වෙනත් ආදායම් | 1,849.25 | 2,114.2 | 1,690.02 | 1,042.83 | 837.49 |
| පොලි ආදායම | 506.20 | 519.4 | 553.42 | 457.21 | 293.71 |
| වෙනත් ලැබීම් | 29.96 | 25.59 | 60.48 | 4680.0 | 1564.0 |
| **මුළු ආදායම** | **111,906.14** | **130,529.49** | **135,446.75** | **126,172.10** | **105,837.39** |
| අඩුකලා - වියඳම් | | | | | |
| ඒ සේවක හා පරිපාලන වියදම් | 77,363.08 | 88,935.0 | 98,994.18 | 91,624.36 | 84691.33 |
| බී ක්ෂය සහ පොදු වියඳම් | 35,854.2 | 38,806.7 | 41,564.02 | 28,208.10 | 33251.66 |
| **මුළු වියදම්** | **113,217.28** | **127,741.78** | **140,558.20** | **119,832.46** | **117,943.00** |
| **අතිරික්තය (ඌණතාවය)** | **1,311.1** | **2,787.6** | **(5,111.45)** | **6,339.64** | **(12,105.1)** |

## මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය
## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය

| විස්තරය | 2021 | | 2020 | |
|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| **මෙහෙයුම් ආදායම්** | | | | |
| පුනරාවර්තන ප්‍රදාන -භාණ්ඩාගාර | | 77,060.00 | | 77,973.00 |
| **වෙනත් ආදායම්** | | | | |
| පාඩමාලා ගාස්තු | | 3,542.50 | | 12,409.64 |
| ගෙවුඩ තාපකරණ ගාස්තු | | 12.0 | | 72.5 |
| පොළී ආදායම් | | 293.71 | | 457.21 |
| විවිධ ආදායම් | | 837.50 | | 1,042.83 |
| 13 වසරක අඛන්ඩ අධ්‍යාපන වැඩසටහන | | 1564.00 | | 4, 680.00 |
| **මෙහෙයුම් ආදායම් එකතුව** | | **83,309.71** | | **96,635.18** |
| **අඩු කළා : මෙහෙයුම් වියදම්** | | | | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | | 51666.29 | | 57,062.68 |
| ගමන් වියදම් | | 53.11 | | 56.99 |
| සැපයුම් හා පාරිභෝජන දව්‍ය | | 2800.79 | | 3,487.59 |
| නඩත්තු වියදම් | | 2062.29 | | 1,926.57 |
| ගිවිසුම් ගත සේවා | | 25,743.55 | | 27,155.46 |
| පුහුණු වියදම් | | 1908.07 | | 1,598.98 |
| වෙනත් මෙහෙයුම් වියදම් | | 443.61 | | 320.25 |
| **මෙහෙයුම් වියදම් එකතුව** | | **84,677.71** | | **91,608.52** |
| **මෙහෙයුම් වලින් ලද අතිරික්තය/ (ඌනතාවය)** | | **(1,368.0)** | | **5,026.66** |
| අඩු කළා - මූල්‍ය පිරිවැය | | (13.62) | | (15.80) |
| ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන | 17,917.47 | | 22,974.54 | |
| වෙනත් ලැබීම් | | | | |
| | 17,917.47 | | 22,974.54 | |
| අඩු කළා - ඍණය කපා හැරීමේ වියදම් | (28,640.97) | (10,723.50) | (21,645.73) | 1,328.81 |
| වෙනත් ප්‍රාග්ධන ආයෝජන ප්‍රතිපාදන | 4610.61 | | 6,562.36 | |
| අඩු කළා - ප්‍රාග්ධන ආයෝජන වියදම් | (3935.71) | | (6,407.94) | |
| ප්‍රාග්ධන වත්කම් සංවර්ධනය කිරීම් | (674.90) | | (154.43) | |
| වෙනත් ප්‍රාග්ධන ආයෝජන වල ශුද්ධ වියදම | | (12,105.12) | | 6,339.67 |
| මෙහෙයුම් නොවන ආදායම් | | | | |
| **එකතු කළා වත්කම් විකිණීමෙන් ලද ආදායම** | | | | |
| **අති විශේෂ අයිතමයන්ට පෙර අතිරික්තය/(ඌනතාවය)** | | (12,105.12) | | 6,339.67 |
| අති විශේෂ අයිතම | | | | |
| **කාලසීමාව සඳහා ශුද්ධ අතිරික්තය / ඌනතාවය** | | (12,105.12) | | 6,339.67 |
| එකතු කළා | | | | |
| පෙර වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය /(ඌනතාවය) | (31,479.11) | | (37,671.85) | |
| අඩු කළා - පෙර වර්ෂ ගැලපීම් | | 4275.30 | | (146.92) |
| **ශුද්ධ අතිරික්තය /(ඌනතාවය)** | | **(39,308.93)** | | **(31,479.11)** |

## මැණික් හා ස්වර්ණාභරන පර්යේෂණ හා අභ්‍යාස ආයතනය
## 2021.12.31 දිනට ශේෂ පත්‍රය

| විස්තරය | 2021 | | 2020 | |
|---|---|---|---|---|
| | රු'000 | රු.'000 | රු'000 | රු'000 |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල යන්ත්‍ර උපකරණ | 129,378 | | 113,695 | |
| පාරිතෝෂික අරමුදල | 2272 | 131,650 | 1271 | 114,966 |
| **ජංගම වත්කම්** | | | | |
| තොග හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 3798 | | 3,489 | |
| විකිණීම සඳහා ඇති පොත් | | | | |
| ණය හා අත්තිකාරම් | 1847 | | 2295 | |
| බැංකු තැන්පතු ගිණුම් | 3980 | | 5912 | |
| තැන්පතු | 610 | | 760 | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ගිණුම් | 8429 | | 12377 | |
| දිළිදුකම පිටුදැකීමේ ව්‍යාපෘතිය | 3577 | | 3577 | |
| පෙර ගෙවීම් | 125 | | 83 | |
| මුදල් හා බැංකු | 8793 | 31,159 | 10061 | 35,065 |
| **වත්කම් එකතුව** | | 162,809 | | 153,520 |
| **වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| ගෙවිය යුතු ගිණුම් | 599 | | 1527 | |
| උපචිත වියදම් | 6727 | 7,326 | 5048 | 6,575 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| Minimata ව්‍යාපෘතිය | 570 | | 270 | |
| පරිතෝෂික සඳහා වෙන්කිරීම් | 14172 | | 15827 | |
| ජාතික විද්‍යා පදනම | | 14,742 | 6590 | 22,687 |
| **වගකීම් එකතුව** | | 22,068 | | 29,262 |
| **ශුද්ධ වත්කම් එකතුව** | | **140,741** | | **124,258** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධ** | | | | |
| සහනාගීත්ව ප්‍රාග්ධනය | 50000 | | 50000 | |
| සංචිත -මැණික් | 43772 | | 2111 | |
| වෙනත් දායක වීම් | 850 | | 850 | |
| සේවක චක්‍රිය අරමුදල | 1721 | | 1565 | |
| විලම්බිත ආදායම් / ප්‍රාග්ධන ප්‍රතිපාදන | 83706 | | 101,211 | |
| සමුච්චිත අරමුදල | (39,308) | | (31,479) | |
| **ශුද්ධ වත්කම් ස්කන්ධ එකතුව** | | **140,741** | | **124,258** |

## මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය
## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(රු., 000)

| විස්තරය | 2021 | 2020 |
|---|---|---|
| **මෙහෙයුම් කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද අතිරික්ත/ඌනතාව | (12,105.12) | 6,339.64 |
| **මුදල් නොවන ගනුදෙනු** | | |
| ක්ෂය වෙන්කිරීම | 28,640.97 | 21,645.73 |
| පොළි | (293.71) | (457.21) |
| ප්‍රාග්ධන වියදම් කපාහැරීම් | | 6,562.36 |
| විලම්බිත ප්‍රාග්ධන ආදායම් ගැලපීම් | (22,528.16) | (29,536.91) |
| අනෙකුත් ජංගම වගකීම් වල වැඩි වීම / අඩුවීම | 610.55 | 4,228.18 |
| දේපල යන්තු හා උපකරණවිකිණීම මත ලාභ | | |
| කල්බදු කුලි | 473.48 | 473.48 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 479.25 | 3,915.28 |
| ස්ථාවර වත්කම් ගැලපීම | (41,660.52) | |
| පාරිතෝෂික ගෙවීම් | (2,134.27) | (991.9) |
| අනෙකුත් ජංගම වත්කම් වල වැඩි වීම | 2,866.50 | (6,288.6) |
| ගෙවිය යුතු පාරිතෝෂික | | (1,024.6) |
| සංචිත | 41,660.52 | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (අ)** | **(3,990.53)** | **4,865.45** |
| **ආයෝජන කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය** | | |
| යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම | (3,136.4) | (2,089.8) |
| පාරිතෝෂික අරමුදලේ වැඩිවීම | (1,000.7) | 251.1 |
| ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් | | (6,562.3) |
| පොළි ආදායම | 450.37 | 584.5 |
| ස්ථාවර තැන්පතු අඩුවීම | 1,932.2 | (416.7) |
| ආපදා ණය ගෙවීම් | (1,364.44) | (1,122.3) |
| ආපදා ණය ලැබීම් | 1,827.31 | 1,480.2 |
| **ආයෝජන කාර්යයන්ගේ ශුද්ධ මුදල් ප්‍රවාහය (ආ)** | **(1,291.57)** | **(7,875.3)** |
| **මූල්‍ය කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය** | | |
| ප්‍රාග්ධන ප්‍රදාන | 5,024.0 | 9,000.0 |
| Minimata ව්‍යාපෘතිය | 300.4 | 175 |
| ජාතික විද්‍යා පදනමෙහි අරමුදල | (1,310.4) | (691.6) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)** | **4,013.95** | **8,483.4** |
| මුදල් හා මූල්‍ය අයිතමයන්ගේ ශුද්ධ වැඩිවීම/අඩුවීම (අ) (ආ) (ඇ) | (12,68.15) | 5,473.5 |
| ආරම්භක මුදල් /මූල්‍ය ශේෂය | 10,061.37 | 4,587.9 |
| **වර්ෂය අවසානයේ මුදල් / මූල්‍ය ශේෂය** | **8,793.22** | **10,061.4** |

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය எனது இல. My No. } අයිඩබ්ලිව්ආර්සී/ජීජේආර්ටීඅයි/01/

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2022 ජූනි 29 දින

සභාපති,

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය.

**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 මතය**

---

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස්

කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද චෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් මිලදී ගත් දිනය පිරිවැය එකතු කිරීම්, ඉවත් කිරීම් ප්‍රත්‍යාගණන වටිනාකම සහ ක්ෂය දැක්වෙන පරිදි විධිමත් ලෙස ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු. රෙ. 571 | වර්ෂ 02 ඉක්ම වූ වටිනාකම රු.269,832 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| බලතල, කර්තව්‍යයන්, කාර්යයන් | නිරීක්ෂණ |
|---|---|
| 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 25(1) වගන්තිය ප්‍රකාරව 1995 ජූලි 28 දිනැති අංක 882 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ 5(3) වගන්තිය | මෙකී නියමයන් ප්‍රකාරව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර නිපදවීම ඇතුළත් ශිල්පීය සහ උපදෙස් සැපයීම සිදුකල යුතු වුවත් එම කටයුතු සිදුකර නොතිබුණි |

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) ජාතික විද්‍යා පදනමේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වූ අර්ධ මැණික්වල වර්ණය හා පැහැදිලි බව වැඩි කිරීම් ක්‍රම හදුන්වා දීම සඳහා සිදුකල ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 21 දින අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී මිලදී ගත යුතුවූ Presser Vesser උපකරණයක් ජාතික විද්‍යා පදනමේ ප්‍රතිපාදන මත රු.999,895 ක මුදලකට ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු එනම්, 2021 අප්‍රේල් 29 දින මිලදී ගැනීමට ආයතනය කටයුතු කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල ගෙවුඩ තාප පිරියම්කරණය පිළිබඳ උනන්දුවන දක්වන පාර්ශවයන් වෙත සේවාවන් 16 ක් සැපයීමට සැලසුම් කර තිබුණත් එක් සේවාවන් පමණක් සපයා තිබුණි.

(ඇ) 2017-2031 කාලය තුල ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 300.65 කින් කරගෙන යනු ලබන ශ්‍රී ලංකාව තුල මැණික් නිධි ගවේෂණය හා ඇගයීමේ ව්‍යාපෘතිය මඟින්, මොණරාගල, බදුල්ල, මාතලේ, රත්නපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 50 ක මැණික් නිධි ගවේෂණය සිදුකර වාර්තා සහ සිතියම් නිකුත් කිරීමට සැලසුම් කලද, දිස්ත්‍රික්ක 04 ක පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක ගවේශණ කටයුතු කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 08 ක පමණක් අවසාන වාර්තා සහ සිතියම් නිකුත් කර තිබුණි.

(ඈ) 2019 වර්ෂයේ සිට මේ දක්වා මැණික් ඇති බවට හදුනාගෙන ඇති ඉඩම් 112 ක විස්තර මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට ලබාදී තිබුණත් මෙම ඉඩම් වෙන්දේසි කිරීම සඳහා යොමු වී නොතිබුණි. එසේම මැණික් ඇති බවට හදුනාගන්නා ලද ඉඩම් මැණික් හා ස්වරණාභරණ අධිකාරියට යොමුකර ඒවා වෙන්දේසි කිරීමෙන් ලැබෙන ආදායමෙන් සියයට 25 ක් ආයතනය වෙත ලබාගෙන එම මුදලින් රු.මිලියන 174.15 ක් 2022-2031 අතර කාලයේ ව්‍යාපෘතියට යෙදවීමට බලාපොරොත්තු වුවත් එම මුදල ලබා ගෙන ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කිරීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(ඉ) අධ්‍යාපන අමාත්‍යාංශය හා ආයතනය අතර 2019 වර්ෂයේ ඇතිකරගත් අවබෝධතා ගිවිසුමක් අනුව "13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන" යටතේ මැණික් කැපීම හා ඔප මට්ටම් කිරීම සහ ස්වර්ණාභරණ නිෂ්පාදනය සඳහා පාසැල් සිසුන්ට පුහුණුව ලබා දෙමින් පැවතුණි. 2019-2021 කාලය තුල මැණික් කැපීම හා ඔප දැමීම සඳහා සිසුන් 185 ක්ද, ස්වර්ණාභරණ නිෂ්පාදන පාඨමාලාව සඳහා සිසුන් 227 දෙනෙකු ද යොමු කර තිබුණත් මේ සඳහා ආයතනයේ පුහුණුව ලබා ගෙන තිබුණේ පිළිවෙලින් සිසුන් 96 සහ සිසුන් 151 ක් පමණි.

(ඊ) මැණික් පිළිස්සීම සඳහා 2013 වර්ෂයේදී රු.10,977,344 කට මිලදී ගත් විදුලි උදුනක් මිලදී ගෙන වර්ෂ 6 ක කාලයක් නිෂ්කාර්යව පැවතුණු අතර 2020 - 2021 කාලය තුල රු.3,953,540 ක මුදලක් දරා මෙම උදුන අමතර කොටස් සහ විදුලි පරිපථ යොදා වැඩි දියුණු කිරීම් කර තිබුණි. ඒසේ වුවත් 2020 - 2021 කාලය තුල දින 14 ක් පමණක් යන්ත්‍රය භාවිතා කර පර්යේෂණ ධාවන වාර 05 ක් සඳහා යන්ත්‍රය භාවිතා කර තිබුණි.

(උ) වර්ෂ දෙකකට වැඩි කාලයක සිට පැවත එන ලැබිය යුතු පාඨමාලා ගාස්තු රු.1,843,950 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගෙන නොතිබුණි. එසේම දිළිඳුකම පිටුදැකීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ආයතනය පවත්වා තිබුණු පාඨමාලා වෙනුවෙන් රු.3,577,394 ක් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබුණද එම ප්‍රමාණය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා නොතිබුණු අතර මෙම ලැබිය යුතු ශේෂය අයකර ගැනීම මතභේදයට තුඩු දී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති